# සකර්බර්ග් මහත්තයෝ, අපේ නමට අත තියන්න එපා!

**ෆේස්** බුක් හිමිකාරිත්වය දරන මාක් සකර්බර්ග් විසින් ‘මෙටා’ (meta) නම් තම වාම චින්තන පර්ෂද නාමය සොරා ගෙන ඇති බවට ග්‍රීසියේ හිටපු මුදල් අමාත්‍ය සහ ප්‍රසිද්ධ වාමාංශික චින්තකයකු වන යානිස් වරුෆාකිස් (Yanis Varoufakis) චෝදනා කරනවා. ඔහු කියා සිටින්නේ එම නාමය සෑහෙන කලක් ඔවුන් විසින් වාමාංශික දේශපාලනික අර්ථයෙන් භාවිත කර ඇති බවත් සකර්බර්ග් විසින් එම නම ‘නව ශිෂ්ටාරයක්’ (New civilization) යන්න අර්ථ ගැන්වෙන ලෙස වෙනත් සන්දර්භයක භාවිත කරමින් ඇති බවයි.




‘මෙටා’ යන නාමය මෙතෙක් යොදා ගෙන ඇත්තේ ‘පශ්චාත් ධනවාදී ශිෂ්ටාචාරය පිළිබද මධ්‍යස්ථානය’ (Center for Post-Capitalist Civilization) යන වාමාංශික චින්තන පර්ෂදය විසින් (left-wing think tank).

එම චින්තන පර්ෂදය තුල නෝම් චොම්ස්කි, බ්‍රයන් ඒනෝ, කෙන් ලෝච් සහ ජේම්ස් ගැල්බ්‍රේච් වැනි ලෝ සුප්‍රකට චින්තකයින් සමූහගතව තිබෙනවා. යානිස් වරුෆාකිස් ද එහි උපදේශකයෙක්.

වරුෆාකිස් මෙසේ සඳහන් කරනවා,

‘මෙටා හි අපගේ දේශපාලන ආකෘතිය වෙනස් එකක්. අප කලාව සහ ඇකඩමික පර්යේෂණ එකට සම්බන්ධ කරගෙන වැඩ කරන්නේ. කාව්‍ය සහ රසාස්වාදය වගේම සංවාදය අප එකම ආකෘතියක් ඇතුලේ කරනවා. ධනවාදය වෙනුවට ඇතිවෙමින් යන නව තාක්ෂණ ධනවාදී වැඩවසම් සමාජය (techno-capitalist feudal society) අපගේ චින්තන ව්‍යාපාරය විසින් අභියෝගයට ලක් කරමින් පවතිනවා. අනාගත ප්‍රගතිශීලි දේශපාලනයක් වෙනුවෙන් මේ මොහොත නිවැරදිව තේරුම් ගැනීම අපේ එක ප්‍රධාන අරමුණක්. මේ ශෝකී පශ්චාත් ධනවාදී සමාජය සහ ඩිස්ටෝපියාව වෙනුවට අලුත් මාවතක් වෙනුවෙන් තමයි අපි සටන් කරන්නේ’.

ඒ නිසා සකර්බර්ග් මහත්තයෝ හොඳ හිතින් කියන්නේ, අපේ නමට අත තියන්න එපා ! Hands off our meta!!

**යානිස් වරුෆාකිස් (ට්විටර්)**

ANOMA PERERA
Barrister, Solicitor & Notary Public
(Attorney-at-Law, Sri Lanka)
*REAL ESTATE* – Residential & Commercial
Purchase, Sale, re/finance
*WILLS & POWERS OF ATTORNEY*
(evening & week end consultations
available by appointment)
NEW LOCATION
Greater Toronto Executive Centre
2985 Drew Road (Airport Rd/Drew)
Suite # 216
Mississauga, Ontario L4T 0A4
Tel: 905-673-5665 Fax: 905-673-1682
E-mail: anomaperera01@gmail.com
